Department of Education,Sabaragamuwa Province/ Weekly School

## නිපුණතා මට්ටම 10.3 - ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ගබඩාකරණය ඵලදායීව දායක කර ගන්නා ආකාරය විමසයි.

- **ගබඩාකරණය** - යනු තොගයක් මිළදී ගන්නා අවස්ථාවේ හෝ නිෂ්පාදනය කළ අවස්ථාවේ සිට ඒවා අලෙවි කරන තෙක් හෝ භාවිතයට ගන්නා තෙක් හෝ බෙදාහරින තෙක් රැස් කර තබා ගැනීමේ හෝ කල්තබා ගැනීමේ ක්‍රියාවලියකි.

- මෙම ක්‍රියාවලිය,
- තොග ලැබීම
- හඳුනා ගැනීම
- පරීක්ෂා කිරීම
- නිවැරදි බව තහවුරු කර ගැනීම
- ගුණත්වය තහවුරු කර ගැනීම
- ඉවතින් තැබීම/පසෙකින් තැබීම
- නිකුත් කිරීම සඳහා නැවත ලබා ගැනීම.

  යනාදියෙන් සමන්විත වේ.

  - එසේ තොග රැස්කර තබා ගැනීම හෝ කල්තබා ගැනීම සඳහා භාවිත කරන ස්ථානය **ගබඩාව** ලෙස හැඳින්වේ.

### අභ්‍යාස

1.ගබඩාවක් ස්ථානගත කිරීමේදී සලකා බැලිය යුතු කරුණු 4ක් ලියන්න.
2.ගබඩාවක භාණ්ඩ ඇසිරීම කළ යුතු ආකාර 6ක් ලියා ඒවා කෙටියෙන් පහදන්න.
3.ගබඩාවක භාණ්ඩ එහා මෙහා කිරීමේදී යොදා ගන්නා විවිධ උපකරණ 4ක් ලියන්න.
4.විධිමත්ව භාණ්ඩ ඇසිරීමෙන් සහ ගබඩාව තුළ භාණ්ඩ එහා මෙහා කිරීමේ උපකරණ භාවිත කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන 4ක් ලියන්න.